ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2013 අප්‍රේල් මස 16 වැනි දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය - 2013 අප්‍රේල්

2012 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය අභියෝග මධ්‍යයේ වුව ද සියයට 6.4 ක ඉහළ වර්ධනයක් අත් කරගත් අතර 2010-2012 කාලපරිච්ඡේදය සඳහා සියයට 7.5 ක ශක්තිමත් සාමාන්‍ය වර්ධන අනුපාතිකයක් වාර්තා කරන ලදී. අයහපත් කාලගුණික තත්ත්වයන් මධ්‍යයේ වුව ද කෘෂිකාර්මික අංශය යථා තත්ත්වයට පත්වීම සහ කාර්මික අංශයේ ස්ථායී වර්ධනය මෙම ආර්ථික වර්ධනය සඳහා දායක විය. සංචාරක සහ මූල්‍ය උප අංශ අඛණ්ඩව වර්ධනය වුව ද, 2012 දී විදේශ වෙළෙඳාම් කටයුතු අඩුවීම හේතුවෙන් සේවා අංශය මන්දගාමී වර්ධනයක් වාර්තා කළේය.

2013 මාර්තු මාසය සඳහා වූ වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය, පුරෝකතනය කළ පරිදි සැලකිය යුතු ලෙස පහළ වැටුණු අතර මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ පදනම් වර්ෂයේ බලපෑම සහ ආහාර මිල ගණන් අඛණ්ඩව පහළ යාමයි. පසුගිය මාස 9 සඳහා සියයට 9.4 ක සාමාන්‍යයක පැවති මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) සියයට 7.5 දක්වා අඩු වූ අතර මූලික උද්ධමනය ද (වාර්ෂික ලක්ෂ්‍යමය) පෙර මාසයේ වූ සියයට 7.4 සිට මාර්තු මාසයේ දී සියයට 6.8 ක් දක්වා අඩු විය. මතුපිට උද්ධමනය සහ මූලික උද්ධමනය මාස 50 ක් මුළුල්ලේම තනි අංකයක මට්ටමේ පැවතුණි. යෝජිත පරිපාලිත මිල ගණන් සංශෝධන හේතුවෙන් මිල මට්ටම් මත තරමක ඉහළ පීඩනයක් ඇති කළ ද, විචක්ෂණශීලී ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්තිවල දායකත්වයෙන් උද්ධමනය මෙම පහළ මට්ටම්වල පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ.

2012 වසර අවසානය වන විට, එ.ජ.ඩොලර් මිලියන 151 ක අතිරික්තයක් වාර්තා කළ ගෙවුම් ශේෂය 2013 වසරේ මේ දක්වා ද අතිරික්තයක් ලෙස පවතින අතර ඉහළ විදේශ විනිමය ගලා ඒම් හමුවේ තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වසරේ මේ

දක්වා කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළෙඳපොළින් එ.ජ.ඩොලර් මිලියන 560 ක් ශුද්ධ වශයෙන් මිල දී ගැනීමත් සමඟ දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 6.9 ක් දක්වා වැඩි වූ අතර එය ආනයනික මාස 4.5 කට සමාන විය.

පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වර්ධනය 2013 පෙබරවාරි මාසයේ දී සියයට 17 දක්වා අඩු වූ අතර එය මාස 25 ක් තුළ සටහන් වූ අවම අගය විය. පුළුල් මුදල් සැපයුම තුළ පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය පෙබරවාරි මාසයේ දී රුපියල් බිලියන 18 කින් ඉහළ ගිය අතර වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සියයට 13.3 ක් විය. මේ අතර, රාජ්‍ය අංශය විසින් ලබාගත් ණය ප්‍රමාණය පෙබරවාරි මාසය තුළ රුපියල් බිලියන 36.7 ක් වූ නමුත් අපේක්ෂිත පරිපාලිත මිල සංශෝධන සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සඳහා අඛණ්ඩව ගනු ලබන ක්‍රියාමාර්ග හමුවේ බැංකු අංශයේ මූල්‍යනය මත රාජ්‍ය අංශයේ රඳා පැවතීම ඉදිරි මාස තුළ දී අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් වශයෙන් පෞද්ගලික අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා යෙදවිය හැකි සම්පත් ප්‍රමාණය වැඩිවීම සහ පසුගිය මාස කිහිපය තුළ බැංකු අංශය මගින් රැස් කරගත් විදේශීය ප්‍රාග්ධනය පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමට අවශ්‍ය සහය සපයනු ඇත.

මේ දක්වා ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබෙමින් පවතින අතර ඒවා ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට ප්‍රමාණවත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය ස්ථිරසාර පදනම මත තවදුරටත් අඩුවීම, මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කිරීම සඳහා අවකාශ සපයනු ඇත.

ඉහත සඳහන් කරන ලද කරුණු සැලකිල්ලට ගනිමින්, මුදල් මණ්ඩලය 2013 අප්‍රේල් 12 වැනි දින පැවති සිය රැස්වීමේදී දැනට පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් එලෙසම පවත්වා ගැනීම සුදුසු යැයි තීරණය කළ බැවින් මහ බැංකුවේ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙළින් සියයට 7.5 ක් සහ සියයට 9.5 ක් ලෙස නොවෙනස්ව පවතිනු ඇත.

ඉදිරියට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථා කාලයේ දී ප්‍රකාශයට පත් කරනු ඇත.